00230

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදි උපාධි පාඨමාලාව- IV වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2023/2024

ගිවිසුම් නීතිය -LLU4805/LWU2311

කාලය : පැය තුනයි (03)

දිනය : 2025 මැයි 10 වේලාව : ප.ව. 1.30 - ප.ව. 4.30

මුළු ප්‍රශ්න ගණන : අටයි (08)

**I කොටසින් අවම වශයෙන් <u>එක් (01)</u> ප්‍රශ්නයක් සහ II කොටසින් අවම වශයෙන් ප්‍රශ්න <u>හතරක් (04)</u> තෝරාගෙන ප්‍රශ්න <u>පහකට (05)</u> පමණක් පිළිතුරු සපයන්න.**

අපේක්ෂකයන්ගේ අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

## <u>I කොටස</u>

**<u>මෙම කොටසින් ඕනෑම ප්‍රශ්ණ එකකට පිළිතුරු සපයන්න.</u>**

1. මහනුවර පදිංචි කීර්තිමත් සූපවේදියෙකු වන අංජලි, 'ස්වීට් ක්‍රේවින්ස්' නමින් ජනප්‍රිය බේකරියක් පවත්වා ගෙන යයි. දෛනික කටයුතු වඩාත් කාර්යක්ෂමව කළමනාකරණය කිරීම සඳහා, ඇය ප්‍රියා ඇගේ නියෝජිතයා ලෙස පත් කරයි. පාරිභෝගික ඇණවුම් හැසිරවීමේ සහ බේකරි කටයුතු සඳහා සහාය වීමේ වගකීම ප්‍රියා ට පවරයි.
පහත සඳහන් අවස්ථා වලදී නියෝජිතවරියක වශයෙන් ප්‍රියාගේ හැසිරීම නිසා ඇතිවන නෛතික ප්‍රතිවිපාක සාකච්ඡා කරන්න:
   අ. අංජලිගේ අනුදැනුමකින් තොරව, ප්‍රියා 'ස්වීට් ක්‍රේවින්ස්' හි බේකරි නිෂ්පාදන වල මිල 15%කින් වැඩිකර අතර එම අමතර ලාභය තමාගේ පෞද්ගලික ඉතිරි කිරීමේ ගිණුමට යොමු කළාය.
   ආ. ප්‍රියා රහසිගතව එම ප්‍රදේශය තුළම තමන්ගේ ම බේකරියක් වන 'ක්‍රේව් බයිට්ස්' ස්ථාපිත කළ අතර 'ස්වීට් ක්‍රේවින්ස්'හි නිරන්තර ගනුදෙනුකරුවන්ගෙන් ඇණවුම් භාර ගැනීමට පටන් ගත්තා ය.
   ඇ. අංජලිගේ අනුදැනුමකින් හෝ කැමැත්තකින් තොරව ක්‍රියා කරමින්, ප්‍රියා විසින් 'ස්වීට් ක්‍රේවින්ස්' හි වැඩ කිරීම සඳහා උප නියෝජිතයෙකු ලෙස ඩිලන්ව පත් කළාය.
   ඇ. ප්‍රියා විසින් 'ස්වීට් ක්‍රේවින්ස්' වෙනුවෙන් ලබාගත් පාරිභෝගික ඇණවුම් කිහිපයක් භාරදීමට අසමත් වූවාය.

(5 x4 =ලකුණු 20)

2. පහත සඳහන් ඕනෑම <u>දෙකක් (02)</u> පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.
   අ. නියෝජ්‍යත්ව නීතිය යටතේ තෙවන පාර්ශවයක් කෙරෙහි ප්‍රධානියාට ඇති වගකීම
   ආ. නියෝජ්‍යත්ව සම්බන්ධතාවක් අවසන් කළ හැකි විවිධ ආකාර

ඇ. නියෝජිතයෙකු වෙනුවෙන් ප්‍රධානියකු සතු යුතුකම්.
ඈ. නියෝජ්‍යාත්ව සබඳතාවන් නිර්මාණය කිරීම

**(2 x10 = ලකුණු 20)**

## II කොටස

**මෙම කොටසින් ඕනෑම ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

3. පහත සඳහන් නඩු වලින් ඕනෑම හතරක (04) වැදගත්කම පැහැදිලි කරන්න.
   a. *Pharmaceutical Society of Great Britain v Boots Cash Chemists Ltd [1953] EWCA Civ 6*
   b. *Cutter v Powell Court of King's Bench Citations (1795) 6 Term Reports 320*
   c. *Carlill v Carbolic Smoke Ball Company* (1893) 1 QB 256
   d. *Hadley v Baxendale [1854] EWHC J70*
   e. *Public Trustee v. Uduruwana 51 NLR 193*
   f. *Gallie v Lee [1970] UKHL 5*

**(5x4= ලකුණු 20)**

4. (i). ගිවිසුම් නීතිය තුල අගනා ප්‍රතිෂ්ඨා ව යන සංකල්පය නිර්වචනය කර වලංගු ගිවිසුමක් සංස්ථාපනයේ දී එහි පවත්නා වැදගත්කම පැහැදිලි කරන්න.

**(ලකුණු 10)**

(ii). අගනා ප්‍රතිශ්ඨාව යන්න සාධාරණ හේතුව නමැති සංකල්පයෙන් වෙනස් වන්නේ කෙසේ ද?

**(ලකුණු 10)**
**(10x2= ලකුණු 20)**

5. (i). ගිවිසුම් නීතිය තුල, 'වගකීමෙන් බැහැර කිරීමේ වගන්ති' යන සංකල්පය නිර්වචනය කර පැහැදිලි කරන්න.

**(ලකුණු 10)**

(ii) යුවළක් හෝටලයක පිළිගැනීමේ කවුන්ටරයේ දී සිය ඇතුළත්වීම ලියාපදිංචි කිරීමේ උපචාරයන් සම්පූර්ණ කරයි. පසුව, ඔවුන්ගේ කාමරයේ බිත්තියේ ප්‍රදර්ශනය කර ඇති දැන්වීමක් හමු විය. එහි සඳහන් වන්නේ අමුත්තන්ගේ පෞද්ගලික දේපළවලට සිදුවන කිසිදු අලාභයක් හෝ හානියක් සඳහා හෝටලය වගනොකියන බවයි. ඔවුන් එහි රැඳී සිටි කාලය තුළ, ඔවුන්ගේ කාමරයෙන් වටිනා භාණ්ඩ කිහිපයක් සොරකම් කරනු ලැබීය.
හෝටලයට වගකීමෙන් බැහැර කිරීමේ වගන්තිය මත රඳා පැවතිය හැකි ද යන්න පිළිබඳව ඔවුන්ට උපදෙස් දෙන්න.

**(ලකුණු 10)**
**(10x2= ලකුණු 20)**

6.

(i) B යනු C ගේ කුලී නිවැසියෙකු වන අතර වසර 3ක කුලී ගිවිසුමක් යටතේ C ගේ නිවසේ කොටසක වාසය කරයි. C නිවසේ අනෙක් කොටසේ ගණිකා නිවාසයක් පවත්වාගෙන යයි. පොලීසිය විසින් කරන ලද වැටලීම් වලදී තමාට සහාය වීමට හිලව් වශයෙන් B විසින් C ට ගෙවිය යුතු කුලිය අත්හැරීමට C එකගවේ. වසරකට පසුව, සිදු වූ ආරවුලකින් අනතුරුව B විසින් C ට තවදුරටත් උදව් කිරීම ප්‍රතික්ෂේප කරයි. පසුගිය වසර සඳහා කුලිය ගෙවන ලෙසට C විසින් Bගෙන් තරයේ ඉල්ලා සිටින නමුත් B විසින් එය ප්‍රතික්ෂේප කරනු ලබයි.
B විසින් නො ගෙවන ලද කුලිය ආපසු ලබා ගැනීම සඳහා C ට කුලී ගිවිසුම බලාත්මක කළ හැකි දැයි පැහැදිලි කරන්න.

**(ලකුණු 10)**

(ii) ජ්‍යෙෂ්ඨ නීතිඥයෙකු වන F, අළුතින් සුදුසුකම් ලත් නීතිඥයෙකු වන R ව ඔහුගේ නීති සමාගමේ සේවය කිරීම සඳහා ඔහු සමග සේවා ගිවිසුමකට එළඹේ. සමාගමෙන් ඉවත් වූ පසු වසර පහක් දක්වා රටේ කිසිදු තැනක නීතිඥ වෘත්තියේ නියැලීම Rට තහනම් කරන වගන්තියක් එම ගිවිසුමේ ඇතුලත් වෙයි.
මෙම වගන්තිය නීත්‍යානුකූලව බලාත්මක කළ හැකි ද යන්න සාකච්ඡා කරන්න. අදාළ නීති මූලධර්ම සහ නඩු තීන්දු නීතිය සමඟ ඔබේ පිළිතුර තහවුරු කරන්න.

**(ලකුණු 10)**

**(10x2= ලකුණු 20)**

7. පහත සඳහන් ඕනෑම **<u>දෙකක් (02)</u>** පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

අ. වලංගු ගිවිසුමකට එළඹීමේ ශක්‍යතා

ආ. වලංගු ගිවිසුමක් ක්‍රියාත්මක කිරීම සඳහා පැවතිය යුතු අවශ්‍යතා

ඇ. *Donatio mortis causa*

ඈ. ගිවිසුමක් ව්‍යාර්ථකරණය වීම

**(10x2= ලකුණු 20)**

8. ඇක්වාක්‍රාෆ්ට් සමාගම, සංචාරක සමාගමක් වන රිවර්රෂ් ඇඩ්වෙන්චර්ස් සමඟ මිරිදිය මසුන් ඇල්ලීම සහ අභියෝගාත්මක ජල ක්‍රීඩා සඳහා සුදුසු බෝට්ටු සැපයීම සඳහා ගිවිසුමකට එළඹුණි. ඒ වහාම රිවර්රෂ් සමාගම විනෝද චාරිකා තුනක් සංවිධානය කර තිබූ හෙයින් ගිවිසුමට අනුව ඇක්වාක්‍රාෆ්ට් සමාගම බෝට්ටු 2024 ජූනි 30 වන දිනට පෙර ලබාදිය යුතු විය.
කෙසේ වෙතත්, බෝට්ටු භාරදෙනු ලැබුවේ 2024 ජූලි 03 වන දින නිසා රිවර්රෂ් සමාගමට අවශ්‍ය පරීක්ෂණ සහ සූදානම් වීම සඳහා ප්‍රමාණවත් කාලයක් ඉතිරි නොවිනි. එම නිසා රිවර්රෂ් සමාගමට සැලසුම් කර පරිදි සංචාර ක්‍රියාත්මක කර ගැනීමට නොහැකි විය. එහි ප්‍රතිඵලයක් ලෙස, සැලසුම් කළ සංචාර වලින් 75% ක් පමණ අවලංගු කිරීමට සිදුව තිබුණි. මෙම ප්‍රමාදය හේතුවෙන් රිවර්රෂ් සමාගමට රු. 200,000 ක පාඩුවක් දරන්නට සිදු වූ බව කියා සිටී.
ගිවිසුම් කඩ කිරීම සඳහා ඇක්වාක්‍රාෆ්ට් සමාගමට එරෙහිව රිවර්රෂ් ඇඩ්වෙන්චර්ස් වෙත ඇති නෛතික ප්‍රතිකර්ම සාකච්ඡා කරන්න.

**(ලකුණු 20)**

*-සියළුම හිමිකම් ඇවිරිණි.-*